

සභාපති තෝමස් එස්. මොන්සන් විසිනි

# තේරීම්

*අපට සදා පහසු වැරදි වෙනුවට අසීරු සත්‍යයන් තෝරාගැනීමට හැකිවේවා1*

සොයුරු සොයුරියනි, අද මා මගේ චාරිත්‍රානුකූල පණිවුඩය ආරම්භකිරීමට පෙර, ඉදිරි මාස සහ වසරවලදී, පහත සඳහන් ස්ථානවල ගොඩනැගීමට නියමිත අළුත් දේවමාළිගා හතරක් ගැන නිවේදනය කිරීමට කැමැත්තෙමි: කියුටෝ, ඉක්වදෝරය; හරාරේ, සිම්බාබ්වේ; බෙලම්, බ්‍රසීලය; සහ ලීමා, පේරු දෙවන දේවමාළිගාවයි.

මා 1963දී ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ ගණපූර්ණයේ සාමාජිකයෙක් බවට පත්වූ විටදී, මුළු සභාවටම ක්‍රියාත්මක දේවමාළිගා 12ක් තිබින. සති දෙකකට පෙර ප්‍රෝවෝ සිටි සෙන්ටර් දේවමාළිගාව කැපකිරීමත් සමග, දැනට ලෝකය මුළුල්ලේම ක්‍රියාත්මක දේවමාළිගා 150ක් තිබේ. මෙම ශුද්ධවූ දේවමාළිගා තුළදී අපට ලැබෙන ආශිර්වාද ගැන අපි බොහෝ කෘතඥ වන්නෙමු.

දැන්, සොයුරු සොයරියනි, මෙම උදෑසන ඔබත් සමග අදහස් කිහිපයක් බෙදාගැනීමට ලැබුන මෙම අවස්ථාව වෙනුවෙන් මගේ කෘතඥතාවය පළකිරීමට මම කැමැත්තෙමි.

මෑතකදී මම තේරීම් ගැන කල්පනා කළෙමි, ඉතිහාසයේ දොර විවරවන්නේ කුඩා සරනේරුවලින් බවට කියමනක් ඇත. ජනතාවගේ ජීවිතත් ඒ වාගේය. අප කරන තේරීම් අපගේ ගමනාන්තය නිශ්චය කෙරෙයි,

අපි අපගේ මැරෙන සුළු ජීවිතයට පෙර ජීවිතයෙන් පිටවී, මැරෙන සුළු ජීවිතයට ඇතුල්වූ විට, අපි කර්තෘත්වය නැමති දීමනාව අපත් සමග රැගෙන ආවෙමු. අපගේ ඉලක්කය වන්නේ සෙලෙස්ටියල් මහිමය ලබාගැනීමය. අප කරන තේරීම්වල විශාල කොටසක්, අප ඉලක්කයට ලඟාවීම හෝ නොවීම තීරණයකරයි.

ඔබලාගෙන් බොහෝ දෙනෙක්, *Alice's Adventures in Wonderland* නම් නවකථාවේ ලුවිස් කැරොල්හි ඇලිස් ගැන හොඳින් දනිති. ඇය තමා ඉදිරියේ පාරවල් දෙකක් සහිත මං සන්ධියකට පැමිණි බව ඔබට මතක ඇත. ඉදිරියේ ඇති හැම පාරක්ම විරුද්ධ දිශාවට විහිදී තිබින. කුමන පාරක යන්නේදැයි ඇය කල්පනාකරන විට, ඇයට චෙසයර් පූසා මුණගැසුන අතර, කුමන පාරක යන්නේදැයි ඇය පූසාගෙන් ඇසුවාය.

පූසා පිළිතුරු දෙමින්, “එය රැඳී පවතින්නේ ඔබට යාමට අවශ්‍ය දිශාව අනුව බව කීය. ඔබට යාමට අවශ්‍ය ස්ථානය ඔබ නොදනී නම්, ඔබ කුමන පාරක ගියත් එහි ප්‍රශ්නයක් නැත.”[1]

ඇලිස් මෙන් නොව, අපට යාමට අවශ්‍ය තැන අපි දන්නා අතර එහි හේතුවෆවට්ක්ද ඇත, මන්ද මෙම ජීවිතයේදී අප අනුගමනය කරන මාර්ගය ඊළඟ ජීවිතයේ ගමනාන්තයට මග පෙන්වන නිසාය.

අප තුල විශාල බලවත් ඇදහිල්ලක් ගොඩනගාගැනීමට අපට හැකිවේවා, එය සතුරාගේ සැලසුමට විරුද්ධවීමට අපට ඇති සාර්ථකම ආරක්ෂාවද වන්නේය—සැබෑ ඇදහිල්ල, අපව දරාසිටිමින්, හරි දේ තෝරාගැනීමට අපට ඇති කැමැත්තද වැඩිකරන්නේය. එවන් ඇදහිල්ලක් නොමැතිව, අප කොහේවත් යන්නේ නැත. එය තිබේනම්, අපගේ ඉලක්ක ඉටුකරගැනීමට අපට පිළිවන.

අප බුද්ධිමත්ව තෝරාගැනීම අවශ්‍යවුවද, අපි අඥාන තේරීම්කරන අවස්ථාද ඇත. අපගේ ගැලවුම්කරුවාණන් විසින් ලබාදුන් පසුතැවීමේ දීමනාව, අප යන මගේ වැරදි නිවැරදිකරගැනීමට හැකියාව අපට ලබාදෙමින්, අප සොයන සෙලෙස්ටියල් මහිමයට මගපෙන්වන ගමන්මගට නැවත යාමටද අවස්ථාව ලබාදෙයි.

ජනප්‍රිය මතවලට විරුද්ධවීමට අවශ්‍ය ධෛර්‍යය අපට ඇතිවේවා, පහසු වැරදි වෙනුවට, අසීරු නිවැරදි දේ තෝරාගැනීමට අපට හැකිවේවා.

හැම දිනකම අපගේ ජීවිතවලදී අප ගන්නා තීරණ ගැන—ගතයුත්තේ ඒ තීරණයද, මේ තීරණයද යයි අපි කල්පනාකරන විට—අපි ක්‍රිස්තුස්වහන්සේව තෝරන්නේ නම්, අපි තේරීම නිවැරදිව කර ඇත්තෙමු

නිතරම එය එසේම වේවා යනු, මාගේ හෘදයාංගම සහ නිහතමානී යාච්ඤාවයි, අපගේ ස්වාමීන්වහන්සේ සහ ගැලවුම්කරුවාණන්වන යේසුස්වහන්සේගේ නාමයෙනි, ආමෙන්.

**සටහන්**


1. සකස්කිරීම, ලුවිස් කැරොල්ගේ, *Alice's Adventures in Wonderland* (1898), 89.

## අපගේ කාලයේ ඉගැන්වීම්

මැයි 2016 සිට ඔක්තෝබර් 2016 දක්වා හතරවෙනි ඉරුදින මෙල්කිසදෙක් පූජකවරය සහ සහන සමිතියේ පාඩම්, 2016 ප්‍රධාන සම්මන්ත්‍රනයේ දෙන ලද කථා එකකින් හෝ වැඩි ප්‍රමාණයකින් සූදානම්කරනු ලැබේ. 2016 ඔක්තෝබර් මස කථා තෝරාගත යුත්තේ, අප්‍රේල් හෝ ඔක්තෝබර් සම්මන්ත්‍රන වලින්ය. තම ප්‍රදේශ තුල පාවිච්චිකරන කථාව කුමක්දැයි ස්ටේක් සහ දිස්ත්‍රික් සභාපතිවරු තීරණය කරති, නැතහොත් ඔවුන් එම වගකීම සභානායකවරුන්ට සහ ශාඛා සභාපතිවරුන් වෙත පවරනු ඇත.

භාෂා ගණනාවකින් කථා ලබාගැනීම සඳහා යන්න, conference.lds.org

© 2016 Intellectual Reserve, Inc. විසිනි. සියලු හිමිකම් ඇවිරිණි. අඑජ මුද්‍රණයකරන ලදී. ඉංග්‍රීසි අනුමැතිය: 6/15. පරිවර්තන අනුමැතිය: 6/15.
*First Presidency message May* 2016 පරිවර්තනයයි. Sinhala. 12865 408



**සභාපති ඩීටර් එෆ්. උක්ඩෝෆ් විසිනි**
පළවෙනි සභාපතිත්වයේ දෙවන උපදේශකවරයා

# උන්වහන්සේ ඔබව තම උරහිස මත තබාගෙන, ඔබව නිවසට රැගෙන යනසේක.

*යහපත් බැටළු එඬේරා තම නැතිවූ බැටළුවා සොයන පරිදි, ඔබ ඔබගේ හදවත ඔසවා ලෝකයේ ගැලවුම්කරුවාණන් දෙස බලන්නේ නම්, උන්වහන්සේ ඔබව සොයාගන්නාසේක.*

මගේ ළමා කාලයේ තිබූ එක් කරදරකාරී මතකයක් පටන්ගන්නේ හමුදා ගුවන් යානයක් මගින් පහරදෙන ඈතින් එන විශාල ශබ්දයකින් මා අවදිවීමත් සමගය. ඉක්මණින්ම අවරපෙත්ත ගැස්සෙමින් මුණුමුණු ගාමින් වාතය කැළඹීම වැඩිවෙමින් එන තවත් ශබ්දයකි. අපගේ මව විසින් හොඳින් පුහුණුකර තිබීමෙන්, ළමයින් වන අපි, අපගේ බෑග්ද රැගෙන, ආරක්ෂිත ස්ථානය තිබෙන කන්ද උඩට දිවයන්නෙමු. අන්ධකාර රාත්‍රියේ අපි දිවයන විට, අහසේ සිට බෝම්බ දමන ස්ථානය සළකුණු කළ කොළපාට ගිනි එළි දිස්වේ. අපූර්වත්වය නම්, සෑම කෙනෙක්ම මෙම ගිනිදැල්ල හඳුන්වන්නේ නත්තල් ගස් ලෙසය.

ලෝක යුද්ධයක් මම දුටුවෙමි, එකල මා සිටියේ හතරවෙනි වියේය.

**ඩෙස්ඩ්‍රෙන්**

මගේ පවුලේ අය ජීවත්වූ ස්ථානයේ සිට ඩෙස්ඩ්‍රෙන් නගරය වැඩි ඈතක නොවේ. එහි ජීවත්වූ අය, මා දැක ඇති දෙය සමහරවිට දහස්වාරයකටත් වඩා දැක ඇත. ටොන් දහස්ගණනක පුපුරන ද්‍රව්‍ය වලින් ඇතිවූ ක්ෂණික ගිණිදැල් ඩෙස්ඩ්‍රෙන් මුළුල්ලේම විහිදී ගියේය, එමගින් නගරය සියයට 90ක් විනාශවූ අතර, සුන්බුන් සහ අළු හැරුන විට ඉතිරිවූයේ ස්වල්පයකි.

කෙටි කාලයක් තුලදී, වරක් “මැණික් පෙට්ටිය” ලෙස හැඳින්වූ නගරය, තවදුරටත් එහි නොවීය. ජර්මන් කතුවරයෙකුවූ, එරික් කැස්ට්නර්, විනාශය ගැන මෙසේ ලීවීය, “ඇයගේ අලංකාරය වසර දහසක් තුලදී ගොඩනැගින, එක් රාත්‍රියකදී එය සම්පූර්ණයෙන්ම විනාශවිය.”[1] යුද්ධයකදී අපේම ජනතාවගේ විනාශය ඇතිවීම මැඩපවත්වන්නේ කෙසේදැයි, මගේ ළමා කලය තුලදී, මට සිතාගැනීමට පවා නොහැකිවිය. අප වටා ලෝකය පෙනීමට තිබුනේ බලාපොරොත්තු රහිත අනාගතයක් නැති එකක් ලෙසය.

පසුගිය වසරේ ඩෙස්ඩ්‍රෙන් වෙත නැවත යාමට අවස්ථාවක් මට ලැබින. යුද්ධයෙන් වසර හැත්තෑවකට පසුව, එය, නැවත වරක්, නගරයේ “මැණික් පෙට්ටියක්” ව තිබින. නටබුන් ඉවත්කර තිබූ අතර, නගරය නැවත පිහිටුවා, දියුණුවී තිබින.

මා එහි සිටි කාලයේදී, අලංකාර ෆ්‍රොරෝන්කර්ච් ලුතරන් සභාව, අපගේ ආර්යාවගේ සභාව, මම දැක්කෙමි. 1700දී මුලින්ම ගොඩනැගුනු, ඩෙස්ඩ්‍රෙන් දිළිසෙන මැණිකක් විය, නමුත් යුද්ධය එය ගල් ගොඩක් කළේය.. අවසානයේදී ෆ්‍රොරෝන්කර්ච් නැවත ගොඩනැගීමට තීරණය කරන තුරු, වසර ගණනාවක්ම එය ඒ අන්දමින්ම තිබින.

හැකියාවක් ලැබුන විටදී, නැවත ගොඩනැගීමට පාවිච්චිකිරීම සඳහා විනාශවූ සභාවේ ගල් ගබඩාකර සංවිධානයකර තිබින. අද මෙම ගින්නෙන් කළු පැහැගත් කැළැල් සහිත ගල් පිටත බිත්තිවල දැකිය හැක. මෙම “කැළැල්” යුද්ධ ඉතිහාසයේ ගොඩනැගිල්ලක් සිහිපත්කරනවා පමණක් නොව, නමුත්, එය බලාපොරොත්තුවේද සිහිවටනයකි—අළුවලින් අළුත් ජවිතයක් නිර්මානයකිරීමට ඇති මිනිසාගේ හැකියාව පෙන්වන මහානුභාසම්පන්න ලකුනක්දවේ.

මම ඩෙස්ඩ්‍රෙන් ඉතිහාසය ගැන සිතාබලමින්, සම්පූර්ණයෙන්ම විනාශවූ

නගරය නැවත පිහිටුවීමේ දක්ෂතාවය සහ අධිෂ්ඨානය ගැන පුදුමවන විට, මට ශුද්ධාත්මයේ මිහිරි බලපෑමක් ඇතිවිය. සැබවින්ම, කැඩුනු නගරයක නටබුන්, ගල්, සහ නෂ්ටාවශේෂ රැගෙන, සිත්කාවදින ලෙස අහස උසට දිස්වන ගොඩනැගිල්ලක් ගොඩනැගීමට මිනිසාට හැකි නම්, වැටුනු සහ පරිශ්‍රම දරන හෝ නැතිවුන තම දරුවන් නැවත පිහිටුවීමට අපගේ සර්ව බලධාරී පියාණන්වහන්සේගේ හැකියාව කෙතරම් වැඩිදැයි මම සිතුවෙමි.

අපගේ ජීවිත සම්පූර්ණයෙන්ම නටබුන්වී තිබෙන බව පෙනීමට තිබුනද එය වැදගත් නැත. අපගේ පාප කෙතරම් රතුපාටට තිබුනද එය වැදගත් නැත. අපගේ තිත්තකම කෙතරම් ගැඹුරුද, කොපමණ, හුදකලාවුවද, අත්හැර දමා හෝ අපගේ හදවත් කෙතරම් කැඩී බිඳී තිබුනද, එය වැදගත් නැත. බලාපොරොත්තු රහිත අය, අපේක්ෂා නැතිව ජීවත්වන අය, විශ්වාසය පාවා දුන් අය, සිය අවංකකම බාරදුන් හෝ දෙවියන්වහන්සේගෙන් හැරීගිය අය, නැවත ගොඩනැගිය හැකිය. කලාතුරකින් සිටින විනාශයේ පුත්‍රයන් හැර, ප්‍රතිෂ්ඨාපනය කළ නොහැකි ලෙස, සිඳී බිඳී ගිය ජීවිතයක් නැත.

ශුභාරංචියේ ප්‍රීතිමත්ම ආරංචිය නම් මෙයයි: අපගේ ප්‍රේමනීය ස්වර්ගික පියාණන්වහන්සේ විසින් ලබාදුන් සදාකාලික සැලසුම, සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අපිරිමිත පූජාවීම තුලින්, අපගේ වැටුනු තත්වයෙන් මුදවාගෙන පවිත්‍රකමට නැවත පිහිටුවීම පමණක්ම නොව, නමුත් මැරෙනසුළු ජනතාවගේ පරිකල්පිත අභිබවා, සදාකාලික ජීවිතයේ උරුමක්කාරයන් බවට පත්ව, දෙවියන්වහන්සේගේ විස්තරකළ නොහැකි මහිමය භුක්තිවිඳින්නන් වීමට අපට හැකිය.

**නැතිවූ බැටළුවාගේ උපමාකථාව**

ගැලවුම්කරුවාණන්ගේ සේවා කාලය තුලදී, උන්වහන්සේගේ කාලයේ ආගමික නායකයන් විසින් "පව්කාරයන්" වශයෙන් නම්කර තිබූ ජනතාව සමග ගැලවුම්කරුවාණන් කාලයගත කිරීම ඔවුහු අනුමත නොකළහ.

සමහරවිට ඔවුන්ට එය පෙනුනේ පාපකාරී හැසිරීම් උන්වහන්සේ ඉවසාසිටීමක් හෝ අනුමතකිරීමක් ලෙස විය හැකිය. සමහරවිට පව්කාරයන්ට පසුතැවීමට උපකාරකිරීමේ හොඳම ක්‍රමය වරදටපත්කිරීම, අවමන්කිරීම හෝ ඔවුන්ව ලජ්ජාවට පත්කිරීම ඔවුන් විශ්වාසකල විය හැකිය.

එරිසිවරුන් සහ ලියන්නන් සිතන දෙය ගැලවුම්කරුවාණන් තේරුම්ගත්විට, උන්වහන්සේ කථාවක් කීසේක:

"නුඹලා අතරින් බැටළුවන් සියයක් ඇති කවර මනුෂ්‍යයෙක් නමුත් උන්ගෙන් එකෙක් නැතිවුනොත් එකුන් සියය වනයේ හැර, නැතිවූ එකා පස්සේ ගොස්, ඌ සම්භවන තුරු නොසොයන්නේද?

"ඔහුට ඌව සම්භවූවිට ඔහු ප්‍රීතිවෙමින්, ඌව කරේ තබාගත්තේය."[2]

ශතවර්ෂ ගණනාවක් මෙම උපමා කථාව සම්ප්‍රදායිකව තේරුම්ගෙන තිබුනේ, නැතිවූ බැටළුවා නැවත ගෙනඒම සහ නැතිවූ අය සොයා යාම ලෙසය. නිසැකලෙසම මෙය කාලෝචිත සහ යහපත් දෙයක් වුවද, එහි තවත් වැඩිදෙයක් ඇතැයි මම කල්පනාකරමි.

පළමුව සහ ප්‍රමුඛ ලෙස, යේසුස්වහන්සේගේ අරමුණ යහපත් එඬේරාගේ කටයුතු ගැන ඉගැන්වීම විය හැකිද?

උන්වහන්සේ සිය අකීකරු දරුවන්ට දේව ප්‍රේමය ගැන සහතිකකරනවා විය හැකිද?

ගැලවුම්කරුවාණන්ගේ පණිවුඩය වූයේ නැතිවූ අය ගැන දෙවියන්වහන්සේ හොඳින්ම දන්නා බවත්—උන්වහන්සේ ඔවුන්ව සොයන බව සහ උන්වහන්සේ ඔවුන් වෙත ගොස්, උන්වහන්සේ ඔවුන්ව ගලවාගන්නවා විය හැකිද?

එය එසේ නම්, මෙම දිව්‍යමය උපකාරයට සුදුසුවීමට බැටළුවා කුමක් කළ යුතුද?

සෙක්ස්තන්කුවේ සම්බන්ධීකරණය එකතුකිරීමට මෙම සංකීර්ණ උපකරණය පාවිච්චිකිරීමට බැටළුවා දන්නේද? එහි සථානය සොයාගැනීමට ජීපීඑස් පාවිච්චිකිරීමට අවශ්‍යතාවයක් ඇතිද? උපකාර කැඳවීමට මෘදුකාංගයක් සකස්කිරීමට ප්‍රවීනතාවයක් එහි තිබේද? ගලවාගැනීමට යහපත් එඬේරා පැමිණීමට පෙර, බැටළුවාට අනුග්‍රාහකයෙකුගේ සටහනක් අවශ්‍යවන්නේද?

නැත, ඇත්තවශයෙන්ම නැත! දිව්‍යමය ගලවාගැනීම ලැබීමට බැටළුවා සුදුසය, මන්ද යහපත් එඬේරා ඌට ප්‍රේමකරන නිසාය.

නැතිවූ බැටළුවාගේ උපමාකථාව මා හට සියළුම ශුද්ධ ලියවිලිවල එන වඩාත් බලාපොරොත්තු ගෙනෙන එක් ශුද්ධලියවිල්ලකි.

අපගේ ගැලවුම්කරුවාණෝ, යහපත් එඬේරාණෝ, අප දැන, අපට ප්‍රේමකරණසේක, උන්වහන්සේ ඔබව දන්නා අතර, ඔබට ප්‍රේමකරනසේක.

ඔබ නැතිවූ විට උන්වහන්සේ එය දන්නා අතර, ඔබ සිටින තැනද උන්වහන්සේ දන්නාසේක. ඔබගේ දුක, ඔබගේ නිහඬ ආයාචන, ඔබගේ බිය, ඔබගේ කඳුළු, උන්වහන්සේ දන්නාසේක.

ඔබ නැතිවූ අන්දම ගැන—ඔබගේම දුර්වල තේරීම් නිසා හෝ ඔබට පාලනයකරගත නොහැකි අවස්ථා නිසා වුවද එය වැදගත් නැත.

වැදගත්වන්නේ ඔබ උන්වහන්සේගේ දරුවෙක් වීමය. එසේම උන්වහන්සේ

ඔබට ප්‍රේමකරනසේක. උන්වහන්සේ තමන් දරුවන්ට ප්‍රේමකරනසේක/

උන්වහන්සේ ඔබට ප්‍රේමකරන නිසා, උන්වහන්සේ ඔබව සොයාගන්නාසේක. උන්වහන්සේ ප්‍රීතියෙන් යුතුව ඔබව උන්වහන්සේගේ උරහිස මත තබාගන්නාසේක, උන්වහන්සේ ඔබව නිවසට රැගෙන ආ විට, උන්වහන්සේ සැමදෙනාටම මෙසේ කියනසේක. “මා සමග ප්‍රීතිවෙයල්ලා, මක්නිසාද මාගේ නැතිවූ බැටළුවා සම්බවීය.”[3]

**අප කළ යුත්තේ කුමක්ද?**

නමුත් ඔබ මෙසේ සිතිය හැකිය, මාගෙන් අවශ්‍යවන්නේ කුමක්ද? සැබවින්ම. ගලවාගැනීම සඳහා බලාසිටිනවාට වඩා වැඩි යමක් මා විසින් කළ යුතුය.

අපගේ ප්‍රේමනීය පියාණන්වහන්සේගේ කැමැත්ත, උන්වහන්සේගේ දරුවන් සියල්ලෝම උන්වහන්සේ වෙත නැවත පැමිණීමය.[4] අපගේ කැමැත්තට විරුද්ධව දෙවියන්වහන්සේ අපව බේරානොගන්නා සේක.

එනිසා අප කුමක් කළ යුතුද?

උන්වහන්සේගේ ආරාධනාව සරළය:

“මා වෙත… හැරී වරෙල්ලා.”[5]

“මා වෙතට වරෙල්ලා.”[6]

“මා සමීපයට වරෙල්ලා, මාද නුඹලා වෙත එන්නෙමි.”[7]

අපව ගලවාගැනීම අවශ්‍ය බව අප උන්වහන්සේට පෙන්වන්නේ එසේය.

එයට යම් ඇදහිල්ලක් අවශ්‍යවේ. නමුත් බලාපොරොත්තු කඩකර නොගන්න. ඇදහිල්ල ඇතිකරගැනීමට ඔබට දැන් නොහැකි නම්, බලාපොරොත් සමග පටන්ගන්න.

දෙවියන්වහන්සේ සිටින බව ඔබ දන්නාබව කීමට ඔබට නොහැකි නම්, උන්වහන්සේ සිටින බවට බලාපොරොත්තුවීමට ඔබට පිළිවන. විශ්වාසකිරීමට ආශාවක් ඇතිකරගැනීමට ඔබට පුළුවන.[8]

ඉන්පසුව එම බලාපොරොත්තුව මත ක්‍රියාකිරීමෙන්, ස්වර්ගික පියාණන් වෙත ලඟාවන්න. දෙවියන්වහන්සේ ඔබ කෙරෙහි උන්වහන්සේගේ ප්‍රේමය දිගුකරනසේක, ගලවාගැනීමේ කටයුතු සහ වෙනස්වීම ආරම්භවනු ඇත.

කල්යාමේදී, උන්වහන්සේගේ ප්‍රේමය ඔබගේ ජීවිතය තුල හඳුනාගැනීමට ඔබට හැකිවනු ඇත. එසේම උන්වහන්සේගේ ආලෝකය තුල සහ උන්වහන්සේගේ මාර්ගයේ ගමන්කිරීමේ ආශාව සමගින් ඇදහිල්ලෙන් යුතුව ඔබ ගන්නා සෑම පියවරක්ම වර්ධනයවනු ඇත.

මෙම ඇදහිල්ලේ පියවර “කීකරුකම” ලෙස අපි හඳුන්වන්නෙමු.

එය මේ කාලයේ ජනප්‍රිය වචනයක් නොවේ. නමුත් කීකරුකම යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචියේ වටිනා සංකල්පයක් වන්නේ, ශුභාරංචියේ ව්‍යවස්ථා සහ නියෝගවලට කීකරුවීම මගින්, “යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ වන්දිගෙවීම තුලින් සියලු මනුෂ්‍ය වර්ගයා ගලවාගැනීමට හැකිවන බව අප දන්නා නිසාය”[9]

අපගේ ඇදහිල්ල වැඩිවන විට, ඇදහිලිමත්භාවයද අපි වැඩිකරගත යුතුය. ඩෙසඩ්‍රෙන් නගරයේ විනාශය ගැන ශෝකවූ ජර්මන් කතුවරයෙක්ගෙන් මම කලින් උපුටා දැක්වූවෙමි. ඔහු මෙම වාක්‍යකණ්ඩයද ලීවේය, “Es gibt nichts Gutes, ausser: Man tut es.” සෙලෙස්ටියල් භාෂාව කථා නොකරන අය වෙනුවෙන් එය මෙසේ පරිවර්තනයකර ඇත, “ඔබ යහපත කරන තුරු, යහපත් කිසිත් නැත.”[10]

සමහරවිට ඔබට සහ මට ආත්මික දේවල් ඉතා දක්ෂ ලෙස කථා කළ හැක. ආගමික මාතෘකා බුද්ධිමත් ලෙස පරිවර්තනයකර ජනතාවගේ සිත් කාවැද්දීමට අපට පුළුවන. ආගම ගැන උනන්දුවෙන් යුතුව, අපගේ සවර්ගීය මාළිගා ගැන සිහින මැවීමට අපට පිළිවන”[11] නමුත් අපගේ ඇදහිල්ල, අප ජීවත්වන ආකාරය වෙනස් නොකරන්නේ නම්—අපගේ විශ්වාසයන් අපගේ දිනපතා තීරණවලට බලපාන්නේ නැති නම්—අපගේ ඇදහිල්ලේ ප්‍රයෝජනයක් නැත. අපගේ ඇදහිල්ල, මියගොස් නැති නම්, සත්‍යයෙන්ම යහපත් නොවන අතර, අවසානයේ මියයාමේ අනතුරක්ද ඇත.[12]

කීකරුකම ඇදහිල්ලේ ජීවනාලියයි. අපගේ ජීවිතවලට ආලෝකය එක්කරන්නේ, කීකරුකම මගිනි.

නමුත් අපි කීකරුකම වැරදියට තේරුම් ගත් බව මට සිතේ. කීකරුකම අපගේ ඉලක්කය කරායාමේ මාර්ගය වෙනුවට, එය ඉලක්කය ලෙස අප දැකිය හැක. නැතහොත් අප ප්‍රේමකරන අය ස්වර්ගීය කාරණා සඳහා ශුද්ධවන්තකිරීමට, නිතර රත්කිරීම තුලින් පණත් නැමැති කිණිහිරය මත තබා කීකරුකම නැමති මිටියෙන් තැලීම අපට කළ හැකිය.

පසුතැවීම සඳහා දැඩි කැඳවීමක් එන අවස්ථා ඇතිබවට සැකයක් නැත. සත්‍යයෙන්ම, මේ ආකාරයෙන් පමණක් ඒ සඳහා ලඟාවන අය සිටින බවට සැකයක් නැත.

නමුත් සමහරවිට, අපි දෙවියන්වහන්සේගේ පණත්වලට කීකරුවන්නේ මන්දැයි පැහැදිළිවන වෙනස් උපමාවක්ද ඇත. අප නොසිතන යම් දෙයකට ආත්මය නමා, කරකවා, තැලීමට කීකරුකම නිවැරදි ක්‍රියාවලියද නොවිය හැක. ඒ වෙනුවට අපව සත්‍යලෙසම සාදා තිබෙන බව අප සොයාගන්නේද ඒ ක්‍රියාවලිය මගින්ය

අපව මවා තිබෙන්නේ සර්වබලධාරී දෙවියන්වහන්සේ විසිනි. උන්වහන්සේ අපගේ ස්වර්ගික පියාණන් වහන්සේ වනසේක. අපි ස්වභාවයෙන්ම උන්වහන්සේගේ ආත්මික දරුවන් වන්නෙමු. අපව බොහෝ වටිනා දිව්‍යමය ද්‍රව්‍යවලින් සාදා, දැඩිව පිරිසිදුකර ඇති

අතර, මෙසේ අපි දිව්‍යමය ද්‍රව්‍යයන් අපතුල රඳවා සිටින්නේනෙමු.

කෙසේ වුවද, මෙම පොළොව මත, අපගේ සිතිවිලි සහ ක්‍රියා දූෂිත, අශුද්ධ සහ අපිරිසිදු දේවල් සමග මිශ්‍රව පවතී. ලෝකයේ දුහුවිලි සහ අපිරිසිදු දේවල් අපගේ ආත්ම කැළැල්කර, අපගේ කුළුඳුල්කම සහ අරමුණ හඳුනාගෙන මතකතබාගැනීම අපට අසීරු කරයි.

නුමුත් මේ සියල්ලට සත්‍යලෙසම අපව වෙනස්කළ නොහැක. අපගේ ස්වභාවයේ මූලික දිව්‍යමය භාවය පවතින්නේය. තවද අපගේ සිතිවිලි සහ හැඟීම් අපගේ ප්‍රේමනීය ගැලවුම්කරුවාණන් දෙසට හරවා, ගෝලකමේ මාවතට අපගේ පියවර තබන මෙහොතේම, යම් අසිරිමත් දෙයක් සිදුවෙයි. දේවප්‍රේමය අපගේ හදවත් පුරවයි, සත්‍යයේ ආලෝකය අපගේ සිත් ආලෝකමත්කරයි, පව්කිරීමේ ආශාව අපට නැතිවී ගොස්, තවදුරටත් අන්ධකාරයේ ඇවිදීමට අපට අවශ්‍ය නොවේ.[13]

අපි කීකරුකම දකින්නේ දඬුවමක් ලෙස නොව, නමුත් අපගේ දිව්‍යමය ගමනාන්තයට යන නිදහස් මාවතක් ලෙසය. එසේම ක්‍රමානුකූලව, දූෂණය, දුහුවිලි, මෙම පොළොවේ සීමාවන්, ඉවත්වීමට පටන් ගැනේ. අවසානයේදී, අප තුල ඇති මිළකල නොහැකි ස්වර්ගීය අය සතු සදාකාලික ආත්මය එළිදරව්වී, යහපත්කමේ දීප්තිය අපගේ ස්වභාවය බවට පත්වේ.

**ඔබ ගලවාගැනීමට සුදුසුවේ**

මා ප්‍රිය සොයුරු සොයුරියනි, මා දයාබර මිතුරනි, අප සත්‍ය ලෙසම සිටින ලෙස, දෙවියන්වහන්සේ අපව දකින බවට මා සාක්ෂිදරමි—එසේම ගලවාගැනීමට අප සුදුසු ලෙස උන්වහන්සේ අපව දකිනසේක.

ඔබගේ ජීවිතය ගරාවැටී ඇතිබව ඔබට හැඟී යා හැකිය, ඔබ පව්කර තිබිය හැකිය, ඔබ බියට පත්ව, අමනාපව, දුක්වෙමින් හෝ සැකයෙන් වද විඳිනවා විය හැකිය.නමුත් යහපත් එඬේරාණෝ සිය නැතිවූ බැටළුවන් සොයාගන්නා ලෙස, ඔබ ලෝකයේ ගැලවුම්කරුවාණන් වෙත ඔබගේ හදවත ඔසවන විට, උන්වහන්සේ ඔබව සොයාගන්නාසේක.

උන්වහන්සේ ඔබව ගලවාගන්නාසේක.

උන්වහන්සේ ඔබව ඔසවා, ඔබව උන්වහන්සේගේ උරහිස මත තබාගන්නාසේක.

උන්වහන්සේ ඔබව නිවසට උසුලාගෙන යනසේක.

ගල් කැබලි සහ නටබුන් අලංකාරවත් නමස්කාර ගෘහයකට පරිවර්තනයකිරීමට මනුෂ්‍ය අත්වලට හැකි නම්, අපගේ ප්‍රේමනීය ස්වර්ගික පියාණන්වහන්සේට අපව නැවත ගොඩනැගීමට කැමැත්ත සහ හැකියාව ඇති බවට විශ්වාසය තැබීමට අපට හැකිය. උන්වහන්සේගේ සැලසුම අප සිටියාට වඩා හොඳට යම් අන්දමකට—අපට කිසිදා සිතාගැනීමට වත් නොහැකි ලෙස අපව ගොඩනැගීමය. ගෝලකමේ මාවතේ හැම පියවරක් සමගම, අපි සදාකාලික පුද්ගලයන් ලෙස සහ අපව සැලසුම්කර තිබෙන ලෙස අසීමිතව වර්ධනයද වනු ඇත.

මෙය මාගේ සාක්ෂියයි, මාගේ ආශිර්වාදයයි, සහ මාගේ යටහත් යාච්ඤාවයි, අපගේ ආචාරීන්වහන්සේගේ පූජනීය නාමයෙනි, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙනි, ආමෙන්.

**සටහන්**

1. බලන්න එරික් කාස්ට්නර්, *Als ich ein kleiner Junge war* (1996), 51–52.
2. ලූක් 15:4–5.
3. ලූක් 5:6.
4. බලන්න "Know This, That Every Soul Is Free,"*ගීතිකා, අංක, 240.*
5. යොවෙල් 2:12.
6. මතෙව් 11:28.
7. දහම සහ ගිවිසුම 88:63.
8. බලන්න ඇල්මා 32:27.
9. ඇදහිල්ලේ කරුණු 1:3.
10. එරික් කාස්ට්නර්, *ඝශ්‍රී ඤ‍ඪීඵඩ ඳීඪීඪීචශ්‍රී ඎචිචඤූශ්‍රී, 'චිශ්‍රීශ්‍රීඤූීඃ ඥ්ඳී ඖචිඩ ඤූශ්‍රී* (1950).
11. "Have I Done Any Good?" *ගීතිකා, අංක.* 223.
12. බලන්න යාකොබ් 2:26.
13. බලන්න යොහාන් 8:12.

© 2016 Intellectual Reserve, Inc. විසිනි. සියලු හිමිකම් ඇවිරිණි. අඑජ මුද්‍රණයකරන ලදී. ඉංග්‍රීසි අනුමැතිය: 6/15. පරිවර්තන අනුමැතිය: 6/15.
*Visiting Teaching message, May 2016* පරිවර්තනයයි. Sinhala. 12865 408